# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2262/33 - 2022 ජනවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, හපුගස්තලාව ජල සම්පාදන ව්‍යාපෘතියේ, හපුගස්තලාව ජල රැඳවුම හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය: DVP/02/01/KY/289
2022 ජනවාරි මස 11 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැඳුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.


1A - G 35814 — 32 (2022/01)


මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 461 C, හල්ගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හල්ගොල්ල අංක 01 ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. එම්. අබේරත්න මහතා විසින් මැන සකස් කරන ලද, අංක 2773/A දරන පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන "හල්ගොල්ල වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 40ක් පමණ වන ඉඩම් කොටසඃ

| | | |
|---|---|---|
| කැබලි අංක | : | 01 ; |
| ඉඩමේ නම | : | හල්ගොල්ල වත්ත ; |
| ප්‍රමාණය | : | පර්චස් 40; |

මායිම්ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. නු. 1275 දරන පිඹුරේ කැබලි අංක 434 හා 428, |
| *නැගෙනහිරට* | : | මු. පි. නු. 1275 දරන පිඹුරේ කැබලි අංක 428, 437 සහ කැබලි අංක 436 හි ඉතිරි කොටස, |
| *දකුණට* | : | මු. පි. නු. 1275 දරන පිඹුරේ කැබලි අංක 436 හි ඉතිරි කොටස සහ කැබලි අංක 435, |
| *බටහිර* | : | මු. පි. නු. 1275 දරන පිඹුරේ කැබලි අංක 435 සහ 434. |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : 01. බී. එම්. ඒ. ජේ. බස්නායක මහතා,
අංක 49,
හපුගස්තලාව,
හල්ගොල්ල අංක 01.

02. බී. එම්. එස්. කේ. බස්නායක මහතා,
අංක 49,
හපුගස්තලාව,
හල්ගොල්ල අංක 01.

EOG 1-0133

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, දෙමෝදර ජල සම්පාදන ක්‍රමය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඇල්ල ජල ගබඩා ටැංකිය හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකයඃ DVP/02/03/BD/396
2022 ජනවාරි මස 11 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 68 බී, ඇල්ල ග්‍රාම නිලධාරී වසමේ ඇල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ගෝඨාභය වනසිංහ මහතා විසින් 2021.08.26 දිනෙන් අඳින ලද අංක 0380 සැලැස්මේ කැබලි අංක 1 ලෙස දැක්වෙන නිව්බර්ග් වත්ත, ක්ෂේත්‍ර අංක SB 1 නමැති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0324 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | |
|---|---|
| *උතුරට* | : මෙම ඉඩමේ ඉතිරි කොටස, |
| *නැගෙනහිරට* | : මෙම ඉඩමේ ඉතිරි කොටස, |
| *දකුණට* | : මෙම ඉඩමේ ඉතිරි කොටස, |
| *බටහිරටද* | : වතු පාර. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 01. හපුගස්තැන්න වැවිලි සමාගම.

EOG 1-0134